# අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටි දරුවන් වෙනුවෙන් පිළිගත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය මූල්‍යාධාර ලබාදීමේ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2023

සේ.නි.භා. අරමුදල් මණ්ඩලීය සාමාජික සාමාජිකාවන්ගේ අ.පො.ස උසස් පෙළ සමත් දූ දරුවන් සඳහා ප්‍රදානය කරනු ලැබූ මූල්‍යාධාර වැඩපිළිවෙළ 2023 වසරේ සිට නව මුහුණුවරකින් ක්‍රියාත්මක වන බව දන්වා සිටිමු. මේ අනුව 2022 වර්ෂයට අදාලව 2023 ජනවාරි මස පැවැත්වූ අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටි දූ දරුවන් හට පිළිගත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් (NVQ) හැදෑරීම සඳහා රු.25,000.00 ක උපරිමයකට යටත්ව මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම මෙම නව ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සිදුවේ.
අනුමත පාඨමාලාවන් පිළිබඳ විස්තර සහ එම පාඨමාලාවන් පවත්වන අනුමත ආයතන පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

## මූලික සුදුසුකම්

- 2023 වර්ෂයේ අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය/ශිෂ්‍යයාවක් වීම. (සමත් වීම අත්‍යවශ්‍ය නොවේ)
- පාසල් අයදුම්කරුවන් හට මෙන්ම බාහිර අයදුම්කරුවන් ලෙස උසස් පෙළ විභාගයට පෙනී සිටි වයස අවුරුදු 23 ට නොවැඩි දරුවන් හට ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකිය.
- ශිෂ්‍ය/ශිෂ්‍යයාව උසස් පෙළ විභාගයට පෙනී සිටින අවස්ථාව වනවිට (2023 ජනවාරි) මව/පියා/භාරකරු මෙම අරමුදලේ සක්‍රීය සාමාජිකයකු විය යුතුය. ඒ අනුව 2022 වර්ෂයට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා 2022 පෙබරවාරි මස සිට 2023 ජනවාරි මස දක්වා සාමාජිකයා වෙනුවෙන් අඛණ්ඩව දායක මුදල් ගෙවා තිබිය යුතුය.
- ස්වයං රැකියා යටතේ ලියාපදිංචි වී ඇති සක්‍රීය සාමාජිකයන්ගේ දූ දරුවන් සඳහා මෙම ප්‍රතිලාභය ගෙවීමේ දී, විභාගයට පෙනී සිටින මාසයට පෙර, ආසන්න මාස 36 ක කාලයක් අඛණ්ඩව දායක මුදල් ගෙවා තිබිය යුතුය.
- දෙමාපියන් දෙදෙනාම සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකත්වය දරන්නේ නම් එක් අයෙකු විසින් පමණක් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එසේම මෙම මූල්‍යාධාර ප්‍රදානයට එක් ශිෂ්‍යයෙකු හිමිකම් ලබන්නේ එක් අවස්ථාවක් පමණි.

## අයදුම් කිරීමේ පිළිවෙළ හා පාඨමාලා තෝරා ගැනීම

ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්තේ නම්,

1. පහත දක්වා ඇති උපදෙස් වලට අනුව අයදුම්පත්‍රයේ එක් එක් කොටස් නිවැරදිව සම්පූර්ණ කරන්න.

## උපදෙස්

- අයදුම් පත්‍රයේ පළමු කොටස :

  ප්‍රතිලාභ ඉල්ලුම් කරනු ලබන ශිෂ්‍ය/ශිෂ්‍යයාවගේ තොරතුරු ඇතුලත් කරමින් සම්පූර්ණ කල යුතුය.

- අයදුම් පත්‍රයේ දෙවන කොටස :

  මව/පියා/භාරකරුගේ පෞද්ගලික තොරතුරු ඇතුලත් කරමින් සම්පූර්ණ කල යුතුය.

- අයදුම් පත්‍රයේ තෙවන කොටස :

  මව/පියා/භාරකරුගේ සේවානියුක්තීන් පිළිබඳ තොරතුරු ඇතුලත් කරමින් සම්පූර්ණ කල යුතුයි.

ඉහත සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කිරීමෙන් පසුව සේවායෝජක විසින් සම්පූර්ණ කළ යුතු අයදුම්පත භාගත (Download) කළ යුතුය. සේවායෝජක මඟින් නිවැරදිව සම්පූර්ණ කර නිල මුද්‍රාව යොදා සහතික කර විද්‍යුත් යොමුව (Link) හරහා නැවත උඩුගත (Upload) කළ යුතුය.

සේවායෝජක විසින් විද්‍යුත් ගෙවීම් ක්‍රමය හරහා (E-Payment) දායක මුදල් ගෙවීම සිදු කරනු ලබයි නම් දායක මුදල් විස්තරය සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.

## අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලියවිලි.

- ශිෂ්‍ය/ශිෂ්‍යයාවගේ ජාතික හැඳුනුම්පතේ පැහැදිළි ඡායා පිටපතක්
- ශිෂ්‍ය/ශිෂ්‍යයාවගේ උප්පැන්න සහතිකයේ පැහැදිළි ඡායා පිටපතක්
- ශිෂ්‍ය/ශිෂ්‍යයාවගේ ප්‍රතිඵල ලේඛනයේ පැහැදිළි ඡායා පිටපතක් (විභාග දෙපාතර්මේන්තුවේ නිල වෙබ් අඩවිය මඟින් භාගත (Download) කර ගත යුතුය)
- සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පතේ පැහැදිළි ඡායා පිටපතක් .
- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන්නේ ( මව/පියා විසින් නොවන අවස්ථාවක ) භාරකරු නම් නීත්‍යානුකූල භාරකාරත්වය සනාථ කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.
- ඉහත සඳහන් ලියවිලි වතර්මාන සේවා යෝජකයා මගින් හෝ ග්‍රාම නිලධාරී මගින් හෝ නීතිඥවරයෙකු මගින් හෝ සාමාදාන විනිශ්චයකාරවරයෙකු මගින් සහතික කර තිබිය යුතු අතර අයදුම්පත සමඟ එකී ලියකියවිලි වල පිටපත් ද (Upload) කළ යුතුය.

- ශිෂ්‍ය/ශිෂ්‍යයාවගේ උප්පැන්න සහතිකයේ සඳහන් වන මව/පියා/භාරකරුගේ නම හා සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් නම අතර වෙනසක් පවතී නම් එම නම් සියල්ලෙන්ම හැඳින්වෙන්නේ එක් අයෙකු බවට සේවායෝජක විසින් සහතික කරන ලද ලිපියක්
- සාමාජිකයාගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් නම හා ආකෘති II වාතර්ා වල සඳහන් නම අතර වෙනසක් පවතී නම් එම නම් සියල්ලෙන්ම හැඳින්වෙන්නේ එක් අයෙකු බවට සේවායෝජක විසින් සහතික කරන ලද ලිපියක්

2. අයදුම්කරුවන් විසින් යොමු කරන ලද අයදුම්පතේ සඳහන් තොරතුරු හා දායක මුදල් ගෙවීම් විස්තර අපගේ වාතර්ා සමඟ පරීක්ෂා කොට මෙම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේද යන්න විද්‍යුත් ලිපියක් (Email) මඟින් හා කෙටි පණිවිඩයක් (SMS) හරහා ඔබට දන්වා එවනු ලැබේ.

3. අප මණ්ඩලය විසින් ඔබගේ අයදුම්පත සුදුසුකම් ලද අයදුම්පතක් ලෙස තහවුරු කිරීමෙන් පසු මෙහි සඳහන් කර ඇති පිළිගත් වෘත්තීය පාඨමාලාවක් තෝරාගෙන (NVQ) එම පාඨමාලාව හැදෑරීමට අපේක්ෂිත අනුමත ආයතනයක ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි වීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසුව අප මණ්ඩලය විසින් අදාළ ආයතනය වෙත පාඨමාලා ගාස්තු ගෙවීමට අදාළව පොරොන්දු ලිපියක් (Guarantee Letter) නිකුත් කරනු ලැබේ.

## පාඨමාලා ගාස්තු ගෙවීම්

පාඨමාලාව සාර්ථකව අවසන් කළ බවට අදාළ සහතික පත්/ලියකියවිලි අප වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව පහත ක්‍රම යටතේ පාඨමාලා ගාස්තු ගෙවීම් සිදු කරනු ලැබේ.

1. පාඨමාලා ගාස්තු ඍජුව වෘත්තීය පුහුණු ආයතනයට ගෙවීම
   පාඨමාලා ලියාපදිංචි ගාස්තුව ඔබ විසින් ගෙවිය යුතුය. රු.25,000.00 ක උපරිම සීමාවකට යටත්ව පාඨමාලා ගාස්තුව අප මණ්ඩලය විසින් අදාළ වෘත්තීය පුහුණු ආයතනයට ගෙවනු ලැබේ.

2. පාඨමාලා ගාස්තු ශිෂ්‍ය/ශිෂ්‍යයාවට ප්‍රතිපූරණය කිරීම
   පාඨමාලා ගාස්තුව අදාළ ශිෂ්‍ය/ශිෂ්‍යයාව විසින් පුහුණු ආයතනයට ගෙවීම් කර ඇත්නම්, ගෙවීම් තහවුරු ලේඛන ඉදිරිපත් කිරීම මඟින් එම මුදල් ප්‍රතිපූරණය කරනු ලැබේ. ඒ සඳහා අයදුම්පත ඉදිරිපත් කිරීමේදී ශිෂ්‍ය/ශිෂ්‍යයාවගේ බැංකු ගිණුම් තොරතුරු අප වෙත ලබා දිය යුතුය.

වැඩි විස්තර සඳහා,
දුරකථන අංක : 0117747200 / 0112503917
0117747281 / 0117747282 (ශිෂ්‍යත්ව අංශය)